## මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ පළාත් පාලන සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තුමය) තනතුර සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය.

මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමිය විසින් අනුමත කරනු ලබන දින සිට මෙම බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය ක්‍රියාත්මක වේ. මෙම පරිපාටිය ක්‍රියාත්මක වීමත් සමඟ මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් 2013-01-09 වන දින අනුමත කරන ලද මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ පළාත් පාලන සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තුමය) තනතුර සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය බල රහිත වේ.

**01.** සම්බන්ධ වන ආයතන

1.1 දෙපාර්තමේන්තුව : මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන දෙපාර්තමේන්තුව
යොමු අංකය : CPC/CLG/1/4/5/2 දිනය: 2015-12-07

1.2 අමාත්‍යාංශය : මධ්‍යම පළාත් ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශය
යොමු අංකය : CPC/CMS/01/07/07 දිනය: 2015-12-21

1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම
යොමු අංකය : DMS/D1/පොදු/11-2 දිනය: 2012-12-19

1.4 මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම්ගේ නිර්දේශය :
යොමු අංකය : CPC/CS 2/3/SM/C(v) දිනය: 2016-01-27

1.5 ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය :
යොමු අංකය : NSCC/10/71/2/SR දිනය: 2016-07-25

1.6 මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය :
යොමු අංකය : CPC/PSC/2/26/2/3 දිනය: 2017-03-07

**02.** පත් කිරීම් බලධරයා පිළිබඳ විස්තරය

2.1 පත් කිරීමේ බලධරයා : මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමිය විසින් බලය පවරන ලද මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

**03.** නිලධර ගණය පිළිබඳ විස්තර

3.1 නිලධර ගණය : විධායක

3.2 ශ්‍රේණි : III, II හා I ශ්‍රේණි

3.3 පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය :

පොදු ස්වභාවය අනුව ප්‍රතිපත්ති සම්පාදනය, විධානය/ අණ දීම, කළමනාකරණය සහ ඒ සම්බන්ධ තීරණ ගැනීම යන කාර්යන්ට ඇතුළත් වූ ද ආයතනයේ ඉහළම විධායක නිලධාරියාට පැවරෙන සමස්ත කාර්ය භාරයේ අන්තර්ගත කාර්යයන් අතරින් තනතුර නිශ්චිත කොට පවරා දෙනු ලබන කාර්යයන් පැවරෙන සේවා ගණයකි.

3.4 කාර්යන් පැවරීම :

ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාවය මත ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය මත පදනම් කොට ගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයෙකුට දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් පවරනු ලැබිය හැක.

ගරු ආණ්ඩුකාරතුමිය විසින්
2017-08-11 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

**04.** පත්වීමේ ස්වභාවය : ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත.

**05.** වැටුප් :

5.1 වැටුප් කේත අංකය : SL 1-2016

5.2 වැටුප් පරිමාණය : රු.47,615 – 10 x 1,335 – 8 x 1,630 – 17 x 2,170 – 110,895/=

5.3 ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර :

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | වැටුප් තලය (රු.) |
|---|---|---|
| III | 01 පියවර | 47,615/- |
| II | 12 පියවර | 62,595/- |
| I | 20 පියවර | 76,175/- |

5.4 වැටුප් ගෙවීම හා අනෙකුත් කරුණු රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි විධිවිධාන අනුව විය යුතුය.

**06.** නිලධර ගණයට අයත් තනතුර

6.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන් :

| අනුමත තනතුරු නාම | තනතුරු අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| පළාත් පාලන සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තුමය) | III/II ශ්‍රේණිය | 01 | 1. වර්තමාන පළාත් පාලන ව්‍යුහය වන මහ නගර සභා , නගර සභා සහ ප්‍රාදේශීය සභාවලට මහ නගර සභා ආඥාපනත, නගර සභා ආඥා පනත සහ ප්‍රාදේශීය සභා ආඥාපනත හා ඊට සම්බන්ධ වන අනෙකුත් අණ පනත් රීති ප්‍රඥප්ති හා අතුරු ව්‍යවස්ථා මඟින් පැවරී ඇති කාර්ය භාරය, නීති රීතිවලට අනුකූලව ඉටු කිරීම පිළිබඳව පළාත් පාලන කොමසාරිස්වරයාට අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීම.<br>2. පළාත් පාලන කොමසාරිස්වරයාගේ උපදෙස් පරිදි අදාළ ක්‍රියාමාර්ග ගැනීම.<br>3. දෙපාර්තමේන්තුවේ සමස්ත කළමනාකරණය සඳහා කොමසාරිස්වරයාට සහාය වීම.<br>4. පළාත් පාලන ක්‍රමය පිළිබඳ ප්‍රතිපත්ති නීති රීති සම්පාදනය කිරීම හා කොමසාරිස්වරයාට ඉදිරිපත් කිරීම.<br>5. කොමසාරිස්වරයාගේ නියමයන් අනුව දෙපාර්තමේන්තුවේ සාමාන්‍ය පරිපාලනය හා නියාමනය<br>6. කොමසාරිස්වරයා විසින් පවරනු ලබන අනෙකුත් කාර්යයන් |

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව :

ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව 01කි. ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීමේ කාර්යන් සඳහා III, II හා I ශ්‍රේණින් සියල්ල ඒකාබද්ධ නිලධර සංඛ්‍යාවට අයත් සේ සැලකේ.

## 07. බඳවා ගැනීමේ ක්‍රමය

7.1 බඳවා ගන්නා අනුපාතය

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | අදාළ නොවේ |
| සීමිත | අදාළ නොවේ |
| කුසලතා | 100% |

7.2 විවෘත බඳවා ගැනීම : අදාළ නොවේ.

7.3 සීමිත බඳවා ගැනීම : අදාළ නොවේ.

7.4 කුසලතා මත බඳවා ගැනීම :

7.4.1 බඳවා ගන්නා ශ්‍රේණිය : III ශ්‍රේණිය

7.4.2 සුදුසුකම් :

7.4.2.1 අධ්‍යාපන සුදුසුකම් : උසස් වීමේ ශ්‍රේණියක් වන බැවින් අදාළ නොවේ.

7.4.2.2 වෘත්තීය සුදුසුකම් : අදාළ නොවේ

7.4.2.3 පළපුරුද්ද :

I. සුදුසුකම් සලකා බලන දිනට විමර්ශන නිලධාරි (විශේෂ ශ්‍රේණියේ) නිලධාරියෙකු ලෙස පත්වීමක් ලබා තිබීම

හෝ

සුදුසුකම් සලකා බලන දිනට විමර්ශන නිලධාරි තනතුරේ I ශ්‍රේණියේ වසර පහ (05) ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

II. සුදුසුකම් සලකා බලන දිනට පූර්වාසන්නතම වසර (05) තුළ සතුටුදායක සේවා කාලයක් තිබීම.

7.4.2.4 කායික සුදුසුකම් : සෑම අපේක්ෂකයකුම මධ්‍යම පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

7.4.2.5 වෙනත් :

1. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය 7.4.2.3 සිට 7.4.2.4 දක්වා සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට හා අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් වන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.
2. සුදුසුකම් සලකා බලන දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළම සතුටුදායක මට්ටමක හෝ ඊට ඉහළ මට්ටමක කාර්යසාධනයක් සහිත සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

ගරු ආණ්ඩුකාරතුමිය විසින්
2017-08-11 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

7.4.3 බඳවා ගැනීමේ ක්‍රමය :

7.4.3.1 ලිඛිත විභාගය : අදාළ නොවේ.

7.4.3.2 වෘත්තීය පරීක්ෂණය : අදාළ නොවේ.

7.4.3.3 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :

| පරීක්ෂා කර ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1. අධ්‍යාපන සුදුසුකම් | 10 | අදාළ නොවේ |
| 2. වෘත්තීය සුදුසුකම් | 10 | |
| 3. පළපුරුද්ද | 60 | |
| 4. භාෂා ප්‍රවීනතාවය | 10 | |
| 5. සම්මුඛ පරීක්ෂණය | 10 | |
| එකතුව | 100 | |

(ඇමුණුම 01 බලන්න)

සටහන : ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී සුදුසුකම්ලත් අයදුම්කරුවන් අතුරින් උපරිම ලකුණු ලබා ගත් අයදුම්කරුවන් බඳවා ගනු ලැබේ. මෙහිදී සුදුසුකම් පරීක්ෂා කිරීම ද සිදු කරනු ලබයි.

7.4.3.3.1 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරන බලධරයා :

මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

7.4.4 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : අභ්‍යන්තර නිවේදනයක් මගින්

## 08. කාර්යක්ෂමතා කඩඉම

8.1

| කුමන කාර්යක්ෂමතා කඩඉම ද යන වග | කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙරද | කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය / ලිඛිත පරීක්ෂණය / වෘත්තීය පරීක්ෂණය / සහතික පාඨමාලා / වෙනත් |
|---|---|---|
| 1 වන කාර්යක්ෂමතා කඩඉම | III ශ්‍රේණියට පත් වී වසර තුනක් (03) ගත වීමට පෙර | ලිඛිත (ඇමුණුම 02) |
| 2 වන කාර්යක්ෂමතා කඩඉම | II ශ්‍රේණියට උසස් වී වසර තුනක් (03) ගත වීමට පෙර | ලිඛිත (ඇමුණුම 03) |
| 3 වන කාර්යක්ෂමතා කඩඉම | I ශ්‍රේණියට උසස් වී වසර පහක් (05) ගත වීමට පෙර | ලිඛිත (ඇමුණුම 04) |

8.2 කාර්යක්ෂමතා කඩඉම් පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක්ද :

වර්ෂයකට අවම වශයෙන් එක් වරක්

8.3 කාර්යක්ෂමතා කඩඉම්වලට අදාළ පරීක්ෂණ පවත්වනු ලබන බලධරයන් කවුරුන්ද :

මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

ගරු ආණ්ඩුකාරතුමිය විසින්
2017-08-11 ..... දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

09. රාජ්‍ය භාෂා ප්‍රවීනතාව :

| ශ්‍රේණිය | ලබා ගත යුතු ප්‍රවීනතාවය |
|---|---|
| 01.රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධාරීන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීනතාව පරිවාස කාලය තුළ ලබා ගත යුතුය. |
| 02. අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 හි විධිවිධාන අනුව අදාළ මට්ටමේ (1 කාණ්ඩයේ) ප්‍රවීනතාව ලබා ගත යුතුය. |

## 10. ශ්‍රේණි උසස් කිරීම

### 10.1 III ශ්‍රේණියේ සිට II ශ්‍රේණියට උසස් කිරීම

10.1.1 සපුරාලිය යුතු සුදුසුකම් :

I. පත්වීම ස්ථිර කර තිබීම.

II. සේවා ගණයේ III ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහයක (10) සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක දහයක් (10) උපයාගෙන තිබීම.

III. අනුමත කාර්ය සාධන ඇගයීම් පරිපාටියට අනුව උසස් වීමේ දිනට පෙරාතුව වූ වසර දහයක් (10) තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

IV. උසස් වීම් දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළම සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

V. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීනතාවය ලබා ගෙන තිබීම.

VI. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වී තිබීම.

10.1.1.1 උසස් කිරීමේ ක්‍රමය :

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් විසින් නියමිත ආකෘති පත්‍රය මඟින් ඉල්ලීමක් කරනු ලැබූ විට, සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි II ශ්‍රේණියට උසස් කිරීම පත් කිරීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.

### 10.1 II ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට උසස් කිරීම

10.2.1 පූර්ව අවශ්‍යතා :

I. පිළිගත් විශ්ව විද්‍යාලයක කළමනාකරණ හෝ රාජ්‍ය කළමනාකරණ පශ්චාත් උපාධියක් ලබා තිබීම.

II. නිලධර ගණයේ II ශ්‍රේණියේ වසර හත (07) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක හත (07)ක් උපයාගෙන තිබීම.

III. පූර්වාසන්න වසර පහ (05) තුළම සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

IV. අනුමත කාර්ය සාධනය ඇගයීමේ පටිපාටිය අනුව උසස් වීමේ දිනට පෙරාතුව වූ වසර හත (07) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

V. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වී තිබීම.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2017-08-11 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

10.2.1.1 උසස් කිරීමේ ක්‍රමය :

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධාරීන් විසින් නියමිත ආකෘති පත්‍රය මඟින් පත්වීම් බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලබූ විට, පත්වීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි I ශ්‍රේණියට උසස් කිරීම පත්වීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.

11. තනතුරුවලට පත් කිරීම :

| තනතුර | සුදුසුකම් |
|---|---|
| මධ්‍යම පළාත් පළාත් පාලන සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තුමය) | නිලධර ගණයේ III ශ්‍රේණියේ නිලධරයෙකු වීම |

12. අන්තර්ග්‍රහණ ක්‍රමවේදය :

(නියමිත දිනට සේවයේ යෙදී සිටින්නන්ට පමණක් අදාළ වේ.)

මෙම බඳවා ගැනීමේ පටිපාටිය ක්‍රියාත්මක වන දිනට සේවයේ යෙදී සිටින පළාත් පාලන සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තුමය) තනතුරට පත් පත්කර ඇති නිලධාරීන් මෙම බඳවා ගැනීමේ පරිපාටිය යටතේ පළාත් පාලන සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තුමය) III ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කෙරේ. අන්තර්ග්‍රහණය හේතුවෙන් වැටුපෙහි හෝ වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදු නොවේ.

13. අර්ථ නිරූපන හා නිර්වචනය

13.1 "ආණ්ඩුකාරතුමිය" යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාතේ ගරු ආණ්ඩුකාරතුමා/තුමිය වේ.

13.2 " කොමිෂන් සභාව" යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව වේ.

13.3 "අමාත්‍යාංශ ලේකම්" යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්වරයා වේ.

13.4 "දෙපාර්තමේන්තු ප්‍රධානියා" යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ පළාත් පාලන කොමසාරිස් වේ.

13.5 "සතුටුදායක සේවා කාලය" යනුවෙන් අදහස් කරනුයේ, රජයේ නිලධරයකු විසින් කාර්යක්ෂමව හා අනලස්ව රාජකාරි ඉටු කිරීම මඟින්ද, සමත්විය යුතුව තිබූ කාර්යක්ෂමතා කඩඉම සමත්වීම මඟින්ද , සිදුකළ යුතුව තිබූ පත්වීම ස්ථිර කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කිරීම මඟින්ද, එම කාලය තුළදී උපයාගත යුතුව තිබූ සියලුම වැටුප් වර්ධක උපයාගෙන ඇත්තා වූ සහ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු නොකරන ලද්දා වූ කාල සීමාවක් වන්නේය.

13.6 "සක්‍රිය සේවා කාලය" යනු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සත්‍ය වශයෙන්ම රාජකාරියෙහි යෙදී සිටි සේවා කාලය වේ. රජයෙන් අනුමත ප්‍රසූත නිවාඩු හැර අනෙකුත් සියලුම වැටුප් රහිත නිවාඩු කාලපරිච්ඡේදයන් සක්‍රිය සේවා කාලය සඳහා ගණනය කරනු නොලබන්නේය.

ගරු ආණ්ඩුකාරතුමිය විසින්
2017-08-11
අනුමත කරන ලදී
ආණ්ඩුකාර ලේකම්

14. සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ රෙගුලාසි, ආයතන සංග්‍රහයේ විධිවිධාන, මුදල් රෙගුලාසි සහ දෙපාර්තමේන්තු නියෝග සහ රජය හා/හෝ පළාත් සභාව විසින් කලින් කලට පනවනු ලබන නීතිරීති හා/හෝ රෙගුලාසි අදාළ වේ.

15. මෙම බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියේ සඳහන් යම් කරුණක් හෝ පරිපාටියෙහි විධිවිධාන සලසා නොමැති යම් කරුණක් සම්බන්ධයෙන් පැන නගින ගැටළුවකදී මධ්‍යම පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගරු ආණ්ඩුකාරතුමිය විමසා ආණ්ඩුකාරතුමියගේ අනුමැතිය පරිදි තිරණය කරනු ලැබේ.

ගරු ආණ්ඩුකාරතුමිය විසින්
2017-08-11 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

**<u>මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ</u>**
**<u>පළාත් පාලන සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තුමය) තනතුරට බඳවා ගැනීම සඳහා වන</u>**
**<u>ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පිළිබඳ ආකෘතිය</u>**

01. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පැවැත්වීමට අදාළ කරුණ :

මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ පළාත් පාලන සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තුමය) තනතුරට බඳවා ගැනීම.

02. ලකුණු ලබා දිය යුතු ක්ෂේත්‍ර

| පරීක්ෂා කර ලකුණු ලබාදෙනු ලබන ශීර්ෂ | උපරිම ලකුණු | සමත් ලකුණු |
|---|---|---|
| **අධ්‍යාපන සුදුසුකම් - ලකුණු 10**<br>රජය පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් පශ්චාත් උපාධියක් හෝ සමාන සුදුසුකම් ලබා තිබීම | 10 | |
| **වෘත්තීය සුදුසුකම් - ලකුණු 10**<br>01) දේශීය පාඨමාලා (මාස 3ක් හෝ ඊට වැඩි) - ලකුණු 07<br>02) විදේශීය පාඨමාලා - ලකුණු 03<br>උපරිම සුදුසුකමට පමණක් ලකුණු පිරිනැමේ. | 10 | |
| **පළපුරුද්ද - ලකුණු 60**<br>I. සුදුසුකම් සලකා බලන දිනට විමර්ශන නිලධාරි විශේෂ ශ්‍රේණියේ පත්වීම් ලබා ඇති නිලධාරියෙකු සඳහා, විශේෂ ශ්‍රේණියේ වසරක් සඳහා ලකුණු 12 බැගින් ද, වසරකට අඩු මාස 06 ක් හෝ ඊට වැඩි විශේෂ ශ්‍රේණියේ පළපුරුද්ද සඳහා ලකුණු 06 ක් ද,<br>විමර්ශන නිලධාරි I ශ්‍රේණියේ වසර පහ 05 ඉක්ම වූ පසු එළඹෙන සෑම වසරක් සඳහාම ලකුණු 06 බැගින් ද, වසරකට අඩු මාස 06 ක් හෝ ඊට වැඩි කාල පරිච්ඡේදය සඳහා ලකුණු 03 ක් ද,<br>තනතුරු දෙකෙහිම උපරිම වසර 05 කටද ලකුණු හිමි වේ.<br>- උපරිම ලකුණු 60 | 60 | අදාළ නොවේ |
| **භාෂා ප්‍රවීණතාව - ලකුණු 10**<br>රජය පිළිගත් ආයතනයක හදාරන ලද ඉංග්‍රීසි භාෂා පාඨමාලා<br>I. සහතික පත්‍ර පාඨමාලා (මාස 06 හෝ ඊට වැඩි) - ලකුණු 05<br>II. ඩිප්ලෝමා (අවුරුදු එකක් හෝ ඊට වැඩි) - ලකුණු 10<br>(උපරිම සුදුසුකමට පමණක් ලකුණු පිරිනැමේ) | 10 | |
| **සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාවය - ලකුණු 10**<br>(නායකත්වය, පෞරුෂත්වය, සන්නිවේදන කුසලතා, ආකල්ප යනාදිය සලකා බලනු ලැබේ) | 10 | |

ගරු ආණ්ඩුකාරතුමිය විසින්
2017-08-11 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

**මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ**
**පළාත් පාලන සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තුමය) තනතුර සඳහා වන**
**I වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය**

1. විභාගයේ නම : මධ්‍යම පළාත් පළාත් පාලන සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තුමය) තනතුර සඳහා වන I වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

2. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| 1. ආයතන රෙගුලාසි | පැය 01 | 100 | 40 |
| 2. මුදල් රෙගුලාසි | පැය 01 | 100 | 40 |

3. විභාගය පවත්වනු ලබන බලධරයා : මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

4. විභාගය පවත්වනු ලබන කාල සීමාව : අවම වශයෙන් වසරකට එක් වරක්

5. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රය | විෂය නිර්දේශය |
|---|---|
| 1. ආයතන රෙගුලාසි | ආයතන සංග්‍රහයේ II, IV, V,VII, VIII, XII, XIII වන පරිච්ඡේද |
| 2. මුදල් රෙගුලාසි | මුදල් රෙගුලාසි සංග්‍රහයේ I, II, III, IV, VI, VIII, පරිච්ඡේද හා රජයේ ප්‍රසම්පාදන ක්‍රියා පරිපාටිය |

ගරු ආණ්ඩුකාරතුමිය විසින්
2017-08-11 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

ඇමුණුම 03

## මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ පළාත් පාලන සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තුමය) තනතුර සඳහා වන II වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය

1. විභාගයේ නම : මධ්‍යම පළාත් පළාත් පාලන සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තුමය) තනතුර සඳහා වන II වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

2. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| විෂයානුබද්ධ දැනුම | පැය 03 | 100 | 40 |

3. විභාගය පවත්වනු ලබන බලධරයා : මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

4. විභාගය පවත්වනු ලබන කාල සීමාව : වසරකට අවම වශයෙන් එක් වරක්

5. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| විෂයානුබද්ධ දැනුම | 1. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනය අනුව පළාත් සභාවලට බලතල පැවරීම හා පළාත් සභා ක්‍රමය පිළිබඳ දැනුම<br>2. මහා නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා සම්බන්ධව හා ප්‍රකාශයට පත් කිරීම හා සම්මත අතුරු ව්‍යවස්ථා ප්‍රකාශයට පත් කිරීම<br>3. මහා නගර සභා, නගර සභා හා ප්‍රාදේශීය සභා සම්බන්ධයෙන් විගණන අධිභාර ක්‍රියාවලිය හා අධිභාර අයකර ගැනීම පිළිබඳ නෛතික තත්වය<br>4. 1970 අංක 7 දරණ මධ්‍යම පළාතේ පළාත් පාලන ආයතන අධීක්ෂණය කිරීමේ ප්‍රඥප්තිය පරිදි කටයුතු කිරීමේ විධි විධාන<br>5. ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති හා සභා රැස්වීම් රීති පිළිබඳ දැනුම |

ගරු ආණ්ඩුකාරතුමිය විසින්
2017-08-11 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

ඇමුණුම 04

**මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ**
**පළාත් පාලන සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තුමය) තනතුර සඳහා වන**
**III වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය**

1. විභාගයේ නම :මධ්‍යම පළාත් පළාත් පාලන සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තුමය) තනතුර සඳහා වන III වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

2. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| සාමාන්‍ය කළමනාකරණය | පැය 03 | 100 | 40 |

3. විභාගය පවත්වනු ලබන බලධරයා : මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

4. විභාගය පවත්වනු ලබන කාල සීමාව : වසරකට අවම වශයෙන් එක් වරක්

5. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රය | විෂය නිර්දේශය |
|---|---|
| සාමාන්‍ය කළමනාකරණය | 1. කළමනාකරණ මූලධර්ම<br>2. කළමනාකරණ ශ්‍රිතයන්<br>3. සහභාගිත්ව කළමනාකරණය<br>4. කළමනාකරණ පරිසර |

ගරු ආණ්ඩුකාරතුමිය විසින්
2017-08-11 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය :- නිර්දේශ කරමු

01. ගාමිණී දසනායක මහතා (සභාපති) ...........................................

02. යූ.ඒ.බෝගහපිටිය මහතා (සාමාජික) ...........................................

03. ජී.ජී.එස්.ඒ.දිසානායක මිය (සාමාජික) ...........................................

04. වී. නන්දකුමාර් මහතා (සාමාජික) ...........................................

05. ඒ.ජේ.එම්.මොහිදීන් නිස්තාර් මහතා (සාමාජික) ...........................................

දිනය ..2017.03.14..........

ආණ්ඩුකාර ලේකම්,

..2017.03.14.... දිනැති කොමිෂන් සභා වාර්තාවේ අංක ...17/386........ යටතේ කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ පළාත් පාලන සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තුමය) තනතුර සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතිය සඳහා කාරුණිකව ඉදිරිපත් කරමි.

දිනය 2017.04.18

.........................................
ලේකම්
මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

නිල මුද්‍රාව

ආර්. එම්. එන්. රත්නායක
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
මධ්‍යම පළාත

ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතිය : අනුමත කරමි. / ~~නො~~කරමි.

අනුමත කරමි / ~~නොකරමි~~

.........................................
නිලුකා ඒකනායක
මධ්‍යම පළාත් ආණ්ඩුකාරවර
20 17-08-11